**ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 10 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 18 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

  මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විසර්ජන පනත අනුව, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුමේ උපරිම හර ශේෂ සීමාව රු. 26,000,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු. 10,000,000 ක් ලෙස සඳහන් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හා සැසඳුම් ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතු වීම. | මින් ඉදිරියට එවැනි තත්ත්වයන් ඇති නොවන ලෙස කටයුතු කරන ලෙස අදාල අංශ දැනුවත් කරන ලදී. |

### 1.6.2 තැන්පතු ගෙවීම් හා ශේෂ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී ගනුදෙනු කිසිවක් සිදු නොවී පවත්වාගෙන යන තැන්පතු ගිණුම් 07 ක 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 17,886,591 ක් විය. | තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | රු. 4,150,000 ක් වූ තැන්පතු ශේෂය 2019 වර්ෂය තුළ අරමුණුගත කාර්යයේ යෙදවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාරය වෙතින් අක්මුදල් නිදහස් කිරීම සඳහා ඉල්ලුම් කර ඇති අතර අනෙකුත් තැන්පතු 06 සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ වෙතින් තවදුරටත් විමසා අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් සියයට 10 ක් ජාතික ක්‍රීඩා අරමුදලට බැර කරනු ලබන අතර 2013 ජූලි සිට එම දායකත්ව ප්‍රතිශතය සියයට 5 ක් දක්වා අඩුකර තිබුණි. ඊට අදාල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාළ අනුමැතිය විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | මෙම කරුණු සෘජුවම ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වලට අදාලවන බැවින් අවශ්‍ය තොරතුරු එම ආයතනයෙන් ලබා ගැනීම සුදුසු බව නිරීක්ෂණය කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| ආදායම් සංකේතය | මූලික ඇස්තමේන්තුගත ආදායම | 2018 දෙසැම්බර් දිනට 31 තථ්‍ය ආදායම | ඉක්මවීම / (ඌනතාවය) මූලික ඇස්තමේන්තුවට සාපේක්ෂව | ඉක්මවීම(ඌනතාවය) / මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| 20.02.01.99 | 120 | 1,792 | 1,672 | 1393 |
| 20.02.02.01 | 4,300 | 6,213 | 1,913 | 44 |
| 20.02.02.99 | 1,300 | 1,928 | 628 | 48 |
| 20.03.01.00 | 117 | 162 | 45 | 38 |
| 20.03.02.99 | 11,500 | 8,643 | (2,857) | (25) |
| 20.03.03.02 | 2,100 | 1,582 | (518) | (25) |
| 20.03.05.00 | 1 | 582 | 581 | 58,100 |
| 20.03.99.00 | 15,000 | 37,456 | 22,456 | 150 |
| 20.05.99.00 | 2,000 | 3,261 | 1,261 | 63 |
| 20.06.04.00 | 16,800 | 25,584 | 8,784 | 52 |
| 30.01.01.00 | 10,000 | 12,486 | 2,485 | 24 |
| | 63,238 | 99,688 | 36,450 | 58 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)ආදායම් සංකේතාංක 02 ක මූලික ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 25 ක ඌනතාවයක් හා සංකේතාංක 09 ක සියයට 24 ක සිට සියයට 58,100 ක් දක්වා ඉක්මවීම් පැවතියද, ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | සංශෝධිත ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර සමස්ථ ආදායම් සහ ලැබීම් කළමනාකරණය කිරීමේ වගකීම දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති නමුත්, 2019 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තුව තුළ 2018 වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ඇතුලත් කර නොමැති බව දන්වා ඇත. |
| **(ආ)20.02.01.99 දරන ආදායම් සංකේතය - අනෙකුත් කුලී** | | |
| දෙපාර්තමේන්තුව විසින් බදු කුලී ගිවිසුම් 03 ක් යටතේ රැස් කර තිබූ රු. 55,105,910 ක ආදායමක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) පූගොඩ ටෙක්ස්ටයිල්ස් සමාගම හා රමෝනා පුද්ගලික සමාගම අතර පැවති කුලී ගිවිසුම 2011 ජූනි 01 දින සිට මේ දක්වා සංශෝධනයකින් තොරව ලිපි මගින් පමණක් දීර්ඝ කරමින් ඉදිරියට ගෙනයාම හේතුවෙන් රජයට ලැබිය යුතු ආදායම අහිමි වී තිබුණි. | විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹිය යුතු වීම. | දැනට වලංගු ගිවිසුම 2019.05.31 දිනෙන් අවසන් වූ විට 2019.06.01 දිනෙන් ආරම්භ වන නව බදු ගිවිසුමක් නීත්‍යානුකූල වන පරිදි සකස් කිරීමට පියවර ගන්නා බව එම දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත. |
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට ඉහත ආදායම් සංකේතාංකය යටතේ හිඟ ආදායම රු. 17,928,725 ක් විය. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිඟ ආදායම් අයකර ගැනීමට අදාල ක්‍රියා මාර්ග ගන්නා ලෙස නිරන්තරයෙන් දැනුම් දීමටත් පසු විපරම් කිරීමට අවශ්‍ය උපදෙස් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇත. |
| **(ඇ)20.02.02.01 දරන ආදායම් සංකේතය - පොළිය - ණයදීම** | | |
| 2018 දෙසැම්බර් 31 දිනට උප ණය ශේෂය රු.167,529,519,308 ක් වූ අතර ඊට අදාල පොලී අය කර ගැනීම් සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම නිසා හිඟ ආදායම් වාර්තාවල සඳහන් පරිදි, ආයතන 07 ක් වෙත දෙනු ලැබූ ණය සඳහා 2018 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු පොළිය රු .2,605,800,105 ක් වී | ණය හා පොලී මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාල ආයතන වෙත සහ වගකිව යුතු අනෙකුත් පාර්ශවයන් වෙත මෙම ණය ශේෂයන් පියවන ලෙස වරින් වර දන්වා යැවීමෙන් අනතුරුවත් මෙම ණය ශේෂ පියවීමට අදාල ආයතන අපොහොසත් වි ඇත. |

තිබුණි.

**(ඇ)20.02.02.99 දරන ආදායම් සංකේතාංකය - පොළිය - වෙනත්**

**-------------------------------------------**

| | | |
|---|---|---|
| (i) 2016, 2017 හා 2018 වර්ෂවල රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අය කර ගත නොහැකි සේ සලකා අත්හැරීමට කටයුතු කර තිබූ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ණය පොළිය රු. 2,871,491 ක් විය. | හිඟ ණය මුදල් අය කිරීම සම්බන්ධව නිවැරදි උපදෙස් හා මඟපෙන්වීම් ලබා දිය යුතු වීම. | අවුරුදු 10 ට වැඩි සේවා කාලයක් ඇති ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධරයන් වෙත ලබා දෙන ආපදා ණය මුදල් සඳහා ඇප කරුවන් අවශ්‍ය නොවන බැවින් එවැනි නිලධාරින් වැඩ තහනමකට ලක්වූ අවස්ථාවකදී එම ණය මුදල සහ පොලිය අයකර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් ලබාගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. |
| (ii)ආයතන 62 කට අයත් වසර ගණනාවක සිට පැවත එන, විශ්‍රාම ගිය, මිය ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ට අදාළව එකතුව රු. 296,593,000 ක ණය ශේෂයන් අය නොවී පැවතුණි. | - එම - | අවුරුදු 10 ට වැඩි සේවා කාලයක් ඇති ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධරයන් වෙත ලබා දෙන ආපදා ණය මුදල් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සලසා නොමැත. එබැවින් මෙම පොලී මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ගතහැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙතින් උපදෙස් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |

**(ඉ)20.03.02.99 දරන ආදායම් සංකේතය - විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ**

---

| | | |
|---|---|---|
| (i) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය ප්‍රකාරව, අයවීමට ඇති මුදල් තව තවත් එකතුවීම වැලැක්වීම සඳහා ක්ෂණික පියවර ගත යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.1,086,843 ක් විය. එහි ඇතුළත් 2016 ට පෙර සිට පැවත එන රු. 971,471 ක ශේෂයෙන් 2018 වර්ෂය තුළදී අය කර ගෙන තිබුණේ රු.13,297 ක් පමණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. | චක්‍රලේඛ ප්‍රකාරව හිඟ මුදල් තව තවත් වැඩිවීම වැලැක්වීමට ක්ෂණිකව පියවර ගැනීම මෙම දෙපාර්තමේන්තුවට ප්‍රායෝගිකව සිදු කිරීම අපහසු කාර්යයක් වන අතර, හිඟ ආදායම් එකතු කිරීම සඳහා අදාල අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු කටයුතු කළයුතු වේ. කෙසේ වුවද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(V) මගින් හා 2018.09.14 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 05/2018 මගින්ද මේ සම්බන්ධයෙන් වූ වගකීම අදාල ආයතන ප්‍රධානීන් වෙත පවරා ඇත. |
| (ii) සමාලෝචිත වර්ෂයේ ආදායම් ගිණුමට ලැබීම් රු.මිලියන 8,815 ක් වුවද, ආපසු ගෙවීම් රු. මිලියන 110.4 ක් හා වැරදි නිවැරදි කිරීම් රු. මිලියන 62.1 ක් වශයෙන් එකතුව රු. මිලියන 172.5 ක ආපසු ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරින්ගේ අධීක්ෂණය ප්‍රමාණවත් නොවූ බව නිරීක්ෂණය විය. | වැරදි නිවැරදි කිරීම් හා ආපසු ගෙවීම් අවම කර ගැනීම සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිළධාරියා විසින් අඛණ්ඩව අධීක්ෂණය කළ යුතු වීම. | භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 05/2018 හි 08 ඡේදය මගින් වැරදි නිවැරදි කිරීම හා ආපසු ගෙවීම් අවම කර ගැනීම සම්බන්ධයෙන් අදාල ආදායම් රැස් කරනු ලබන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් වෙත උපදෙස් ලබාදී ඇත. |

**(ඊ)20.05.99.00 දරන ආදායම් සංකේතය - වර්තන පැවරීම - ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්**

---

| | | |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය තුළදී ලොතරැයි 07 කින් ලැබුණු එකතුව වූ රු. 3,770,722,361 ක් වූ මුදල් අදාළ ලොතරැයි පිහිටුවීමේ අරමුණුවලට යොදවා නොතිබුණි. | ආදායම් අදාළ අරමුණුවලට යෙදවිය යුතු වීම. | අරමුදල්වලට මුදල් ලබා දීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල 249-01-01-1503-01 වැය විෂය යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති අතර අදාල ආයතනය විසින් අපේක්ෂිත කාර්යය සැලැස්ම අනුව අවශ්‍ය වන මුදල් මෙම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරනු ලැබූ විට භාණ්ඩාගාරය විසින් මුදල් අවශ්‍යතාවය සහ භාණ්ඩාගාරයේ ද්‍රවශීලත්වයද සැලකිල්ලට ගෙන මෙම මුදල් නිදහස් කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| | | කරනු ලැබේ. |
| (ii) ජාතික සම්පත ලොතරැයි ආදායමෙන් සෞඛ්‍ය සංවර්ධනයට 1998 දී සියයට 10 ක් වූ ලොතරැයි දායකත්වය 2007 වර්ෂයේදී සියයට 15 ක් වී තිබුණි. එසේ වුවද ලොතරැයි මිල රු.10 සිට රු. 20 දක්වා ඉහල නන්වන තෙක් හෝ අලෙවිය වර්ධනය වන වර්ෂයක් දක්වා පමණක් පවත්වා ගැනීමටත් යටත්ව, 2007 වර්ෂය දක්වා අලෙවියෙන් සියයට 15 ක් වූ ලොතරැයියේ දායකත්වය 2008 වර්ෂයේ සිට සියයට 10 ක් දක්වා අඩුකර තිබුණි. එසේ වුවද, 2008 වර්ෂයේ සිට ලොතරැයි මිල රු. 10 සිට රු. 20 දක්වා ඉහල ගොස් තිබුණු අතර, 2012 වර්ෂයට සාපේක්ෂව ලොතරැයි අලෙවි ආදායම ද වැඩි වී තිබුණද, ජාතික සම්පත ලොතරැයියෙන් සෞඛ්‍ය සංවර්ධන අරමුදලට වූ දායකත්වය සියයට 10 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. මේ අනුව 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සෞඛ්‍ය සංවර්ධන අරමුදලට අහිමි වී තිබුණු දායකත්වය රු. 204,106,804 ක් විය. | ආදායම් සංකේතාංක අධීක්ෂණ කටයුතු විධිමත් කළ යුතු වීම. | අදාල ආයතනය විසින් අපේක්ෂිත කාර්යය සැලැස්ම අනුව අවශ්‍ය වන මුදල් මෙම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරනු ලබන අතර භාණ්ඩාගාරය විසින් මුදල් අවශ්‍යතාවය සහ භාණ්ඩාගාරයේ ද්‍රවශීලත්වයද සැලකිල්ලට ගෙන මෙම මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) රණවිරු සේවා අධිකාරියට ආරම්භයේදී ජයවිරු ලොතරැයි ආදායමෙන් සියයට 30 ක දායකත්වයක් ලබාදී තිබුණද, 2011 වර්ෂයේදී ලොතරැයියේ නම සුපිරි වාසනා සම්පත ලෙස වෙනස් වී තිබුණු අතර 2011 දෙසැම්බර් මාසයේ සිට එම දායකත්වය සියයට 10 ක් දක්වා අඩු කිරීමට ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි. එම හේතුවෙන්, රණවිරු සේවා අධිකාරියට 2011 දෙසැම්බර් සිට 2018 වර්ෂය අවසානය දක්වා අහිමි වූ ආදායම රු. 1,123,436,948 ක් වී තිබුණු අතර, එම හිඟ දායකත්වය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ආදායම් සංකේතාංක අධීක්ෂණ කටයුතු විධිමත් කළ යුතු වීම. | දැනට පවතින තත්ත්වය යටතේ ලබා දිය හැකි දායකත්වය සියයට 10 ක් පමණක් වන බවත් ප්‍රතිශතය වැඩිකිරීමෙන් ලොතරැයි පවත්වා ගෙන යාමට නොහැකි බවත් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දන්වා ඇත. |

| | | |
|---|---|---|
| **(උ)20.06.04.00 දරන ආදායම් සංකේතය - ණය ආපසු අයකර ගැනීම** | | |
| (i) ආදායම් සංකේතාංකයට අදාලව ආදායම් ගණන්දීමේ නිලධාරි විසින් 2017 ජූලි මාසයේ රු. මිලියන 16,120 ක් වූ මූලික ඇස්තමේන්තුව හා 2018 ජූලි මාසයේදී රු. මිලියන 23,604 ක් වශයෙන් සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද, එම අගයන් රු. මිලියන 16,800 ක් වූ වාර්ෂික ඇස්තමේන්තු අගයන්වලින් වෙනස් වී තිබුණු අතර ඊට හේතු විගණනයට ඉදිරිපත් නොවීය. | ආදායම් පුරෝකතනය විධිමත්ව සිදු කල යුතු වීම. | විගණන විමසුමේ එම අගයන් ඇස්තමේන්තු අගයන් සමඟ වෙනස් බව දක්වා තිබුණද විමසුම එම අගයන් පිළිබඳ විස්තර දක්වා නොමැත. |
| (ii) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2018 ජනවාරි 01 දින වනවිට උප ණය ලෙස රු.181,246,818,277 ක් ලබා දී තිබුණු අතර, වර්ෂය තුළ අයවීම් රු.25,583,642,347ක් විය. වර්ෂය තුලදී තවදුරටත් රු.11,866,343,377 ක් උප ණය ලෙස ලබාදී තිබුණු අතර වෙනත් ගැලපුම්ද (විනිමය අනුපාතයන්හි වෙනස්වීම) සමඟ 2018 දෙසැම්බර් 31 දින වනවිට ශේෂය රු.167,529,519,308 ක් විය. ආයතනය වෙත ලබා දී තිබූ මුදලින් 2018 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට අපොහොසත් වූ ණය ශේෂයන් පහත පරිදි විය. | | |
| • ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව වෙත 1999 හා 2000 වර්ෂවලදී පිළිවෙලින් ලබා දී තිබූ රු. 550,990,000 ක් හා රු. 222,350,000 ක් වූ ණය ශේෂය. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව - අදාල ණය මුදල අමාත්‍යාංශ නිර්දේශ මත කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම. |
| • ලංකා ධීවර සංස්ථාව වෙත අවස්ථා 03 කදී ලබා දුන් රු. 116,000,000 ක් වූ උපණය ශේෂය. | -එම- | ලංකා ධීවර සංස්ථාව - ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම සමඟම ණය පියවීම සඳහා වන සැලසුමද භාණ්ඩාගාරය වෙත ලබා දීමට ආයතනය එකඟ විය. |

| | | |
|---|---|---|
| • ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ගිවිසුම් 06 කට අදාලව ලබා දී තිබුණු උපණය මුදලින් අයවිය යුතු ශේෂය රු. 2,577,284,323 ක් විය. මෙකී ණය අයකර ගැනීම සම්බන්ධව 2017 ඔක්තෝබර් 03 භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී අවම වශයෙන් මාසිකව රු. මිලියන 10 බැගින්වත් ගෙවීමට අවශ්‍ය කටයුතු කරන මෙන් දැනුම් දුන් බව හිඟ ආදායම් වාර්තාවේ දක්වා තිබුණද ඊට අදාළ ප්‍රගතියක් වාර්තා නොවුණි. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - ආයතනයේ මූල්‍ය තත්වය අනුව ණය ආපසු පියවීමට හැකියාවක් නොමැතිවීම සලකා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය මුදල කොටස් ප්‍රාග්ධනය බවට පත් කිරීමට කටයුතු කිරීම. |
| • මිල්කෝ ආයතනයේ කර්මාන්ත ශාලා නවීකරණය (i) කොටස වෙනුවෙන් අදියර 1 හා 2 යටතේ ලබා දී තිබූ උපණය මුදලින් රු. 4,501,780,602 ක් හිඟව පැවතුණි. | -එම- | මිල්කෝ ආයතනය - ණය මුදලින් කොටසක් එම ආයතනය සතු දේපලක් විකිණීමෙන් ලැබෙන මුදලින් පියවීමට හා ඉතිරි ණය මුදල ප්‍රතිව්‍යුහගතකර ගෙවීම් ආරම්භ කිරීමට පියවර ගැනීම. |
| • 1992 වර්ෂයේදී සණස සංගමයට අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ලබා දී තිබූ රු. 11,114,479 ක මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගෙන නොතිබුණි. එසේම, ලිපිගොනුව අනුව මෙම ණය ශේෂය රු. 11,114,479 ක් වුවද, අදාළ උපලේඛනයෙහි එය රු. 12,056,479 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ඒ අතර වෙනස රු. 942,000 ක් විය. | -එම- | සණස සංගමය හා සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන (ගැරන්ටි) ලිමිටඩ් වෙත ලබාදී ඇති උපණය අයකර ගැනීමට නීති කටයුතු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු නීතිපති මඟින් හිමිකම් කැඳවීමේ ලිපියක් (Letter of Demand) යැවීම සඳහා අවශ්‍ය ලේඛන නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |
| • සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් වෙත ව්‍යාපෘතියක් සඳහා ලබා දී තිබූ රු. 1,333,994,396 ක ණය මුදල 2018 මාර්තු 31 දින වන විට සම්පූර්ණයෙන්ම | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | |
|---|---|---|
| ගෙවා නිමකල යුතු වුවත්, ඉන් රු. 633,395,760 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | | |
| • සී/ස ජාතික කඩදාසි සමාගමට ලබා දී තිබූ රු. 50,000,000 ක පොළී රහිත ණය මුදලින් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | -එම- | දැනට අක්‍රීය තත්වයේ පවතින සී/ස ජාතික කඩදාසි සමාගම සහ ලංකා පිඟන් සංස්ථාව එම ණය කපා හරින ලෙස දන්වා ඇති අතර අදාල අමාත්‍යාංශයන්හි නිර්දේශ සහිතව එම ණය මුදල් කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| • ලංකා පිගන් සංස්ථාවට 2007 ඔක්තෝබර් මාසයේදී දින ලබා දී තිබූ රු. 9,400,000 ක පොළී රහිත ණය මුදලින් අය විය යුතු මුදල රු. 8,676,923 ක් විය. | -එම- . | |
| • ආසියානු සංවර්ධන බැංකුවෙන් 1993 වර්ෂයේදී ලබා ගත් රු. 276,749,960 ක ණය මුදල, මහනගර සභා හා නගර සභා ව්‍යාපෘති සඳහා උපණය ලෙස ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණු අතර, 2019 මැයි 24 දින වන විටත් ඉන් රු.179,746,403 ක් හිඟව පැවතුණි. | -එම- | නාගරික සංවර්ධන අධිකාරියේ අයවිය යුතු මුදල් පිළිබඳව 2019.05.24 දින පැවැති රැස්වීමේදී ඉතිරි හිඟ ණය මුදල පියවීම කඩිනම් කිරීමට කටයුතු යෙදිම පිළිබඳවද සාකච්ජා කරන ලදි. |
| • ගෝල්ඩන් කී තැන්පත්කරුවන් වෙත ගෙවීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට 2015, 2016 හා 2017 වර්ෂවලදී ලබා දී තිබුණු එකතුව රු. මිලියන 7,489.9 ක් වූ උපණය සඳහා ගිවිසුම්වලට එළඹීමට හෝ උපණය ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2019.01.16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ගේ ලිපියෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019.04.01 දිනැති ලිපියෙන් උප ණය ගිවිසුමකට එළඹීම ප්‍රතික්ෂේප කරන ලද බව දන්වා ඇත. එබැවින් උප ණය ලෙස මෙම මුදල ගිණුම් ගත කිරීමට නොහැකි වී ඇත. |
| (iii) 2018 දෙසැම්බර් 31 දිනට උපණයවලට අදාල ඍජු ශේෂ සනාථ කිරීම් හා භාණ්ඩාගාර පොත්වල සඳහන් අගයන් සැසඳීමේදී, උපණය ගිවිසුම් 03 කට අදාළව භාණ්ඩාගාර පොත් හා ශේෂ සනාථ කිරීම් අතර රු. 54,516,590 ක වාසිදායක ශේෂයක්ද, උපණය ගිවිසුමකට | -එම- | භාණ්ඩාගාර පොත් හා ශේෂ සනාථ කිරීම් අතර වූ වාසිදායක ශේෂ ලෙස විගණන විමසුමේ දක්වා ඇති ගිණුම්වලට අදාල වෙනස්කම් අතර 2019 වර්ෂයේ ලැබීමක් 2018 වර්ෂයේ ගිණුම් ගතවීම හා අනිකුත් වෙනස්කම් නිවැරදි කිරීම සඳහා ආයතනයට දැනුම්දීම සිදුකර ඇත. |

අදාළ රු.363,310 ක අවාසිදායක ශේෂයක්ද නිරීක්ෂණය විය.

**(ඍ)30.01.01.00 දරන ආදායම් සංකේතාංකය - විදේශීය ප්‍රදානයන්**

-----------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | විදේශ ආධාර සම්බන්ධ සියළු ගනුදෙනු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කලයුතුයි. එසේ වුවද දෙපාර්තමේන්තුවේ දැනුවත් වීමකින් තොරව ආයතන 03 ක් විසින් සමාලෝචිත වර්ෂය තුල රු. 114,879,740 ක විදේශ ප්‍රදාන සෘජුවම අදාළ ආයතන වෙත ලබාගෙන තිබුණු අතර, මෙම ප්‍රදානයන් පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුවේ වාර්තාවල ඇතුළත් වී නොතිබුණි. | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ විදේශාධාර ගිණුම්තැබීමට අදාල රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විදේශ ආධාර ලබා ගැනීම හා ගිණුම්ගත කිරීම සිදු කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 න් සංශෝධිත 2.0 ඡේදය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ XI පරිච්ඡේදයෙහි වූ විධිවිධාන නොසළකා සෘජුවම විදේශ ප්‍රදාන ලබාගන්නා රාජ්‍ය ආයතන වෙත උපදෙස් නිකුත් කරන ලෙස විදේශ ප්‍රදාන ඇතුළු සියළු විදේශාධාර සම්බන්ධ ගනුදෙනු කිරිමේ වගකිම පවරා ඇති විදේශ මිපත් දෙපාර්කමේන්කුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනටමත් දන්වා ඇත. |
| (ii) | 2018 වර්ෂය තුල විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මුදලින් අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා එකතුව රු. 4,097,369,970 ක අයවැය ප්‍රතිපාදන ලබාදී තිබුණි. එසේ වුවද අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණේ එකතුව රු. 2,182,582,747 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 53.3 ක් පමණි. ඒ අනුව ව්‍යාපෘති සඳහා වෙන්කල රු. 1,914,787,223 ක අයවැය ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. එසේ තිබියදී සමාලෝචිත වර්ෂය අවසානයට ලැබී තිබූ රු. 1,321,843,434 ක විදේශ ප්‍රදාන ගිණුම්ගත කර නොතිබුණි. | විදේශ ප්‍රදාන උපයෝජනය කිරීම විධිමත් කළ යුතු වීම. | විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මුදල් මූලිකව විශේෂ තැන්පතු ගිණුමක රඳවා ගන්නා ගෙන එක් එක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් සඳහා අයවැය ප්‍රතිපාදනඅදාළ ව්‍යාපෘති අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවීමෙන් වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ඉතිරි විය හැක.<br>මෙම තත්ත්වය වළක්වාලීම/ අවම කිරීම සඳහා ප්‍රතිපාදන ඌණ උපයෝජනය සම්බන්ධයෙන් පිළිගත හැකි හේතු අදාළ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු බවට අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ලබාදීමට පියවර ගනු ලැබේ. |
| (iii) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී විදේශ ප්‍රදාන ව්‍යාපෘති 17 ක රු. 44,467,698 ක ශේෂය හා | ලැබුණු විදේශ ප්‍රදාන අදාල අරමුණුවලට | විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මුදල් මූලිකව විශේෂ තැන්පතු ගිණුමක රඳවා ගන්නා අතර එක් එක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල විදේශ ප්‍රදාන ව්‍යාපෘති 04ක් සඳහා ලද රු. 14,448,912 ක මුදල්, අදාල අරමුණුවලට නොයොදවා වර්ෂය අවසන් වනවිටත් නිශ්කාර්යව පැවතුණි. | යෙදවිය යුතු වීම. | බලාපොරොත්තු වන කාර්යයන් සඳහා ඇස්තමේන්තුගත මුදල අයවැය ප්‍රතිපාදන හරහා ලබාදීමට කටයුතු කරනු ලැබේ.<br>කෙසේ වෙතත්, අදාළ ව්‍යාපෘති අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවීමෙන් වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ඉතිරි විය හැක. |
| (iv) විදේශ ප්‍රදාන ව්‍යාපෘති 28 ක් සඳහා ලැබී තිබුණු රු. 3,101,158,763 ක මුදලක් අදාළ අරමුණුවලට නොයොදවා වර්ෂය තුළ රාජ්‍ය ආදායමට බැරකර තිබුණි. මෙය පෙර වර්ෂයේ රාජ්‍ය ආදායමට බැර කල විදේශ ප්‍රදාන මුදල වූ රු. 1,254,540 සමඟ සැසඳීමේදී සියයට 247,195 ක ප්‍රතිශතයක් විය. | -එම- | පිළිගත හැකි කිසියම් හේතුවක් නිසා අපේක්ෂිත ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක නොවන අවස්ථාවලදී විදේශ ප්‍රදාන ආකාරයෙන් ඒ සඳහා ලැබී ඇති මුදල් රඳවා ඇති තැන්පතු ගිණුම්වලින් ඉවත්කොට රජයේ ආදායමට බැර කර එකී තැන්පතු ගිණුම් වසා දැමීම සිදුකරනු ලබයි. කෙසේ වුවද,<br>අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් රටට ලැබෙන කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිලාභ නොලැබීයාමක් සිදුවී ඇතත් අදාළ ප්‍රදාන ඒකාබද්ධ අරමුදලට ලැබීමක් ලෙස ගිණුම්ගතවීම සිදුවී ඇත. |
| (v) විදේශ ප්‍රදාන ව්‍යාපෘති 08 ක් සඳහා ලැබී තිබූ රු. 22,919,139 ක මුදලක් කිසිඳු උපයෝජනයක් නොකර සමාලෝචිත වර්ෂය තුළ අදාළ ප්‍රදානකරුවන් වෙත ආපසු යවා තිබුණි. | -එම- | ඇතැම් විදේශ ප්‍රදාන ගිවිසුම් අනුව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත් වූ විට හෝ නියමිත කාලරාමුවක් තුළ අදාළ ප්‍රදාන වියදම් නොවන අවස්ථාවලදී හෝ ශ්‍රී ලංකා රජයට අදාළ ප්‍රදාන කොන්දේසි හා එකඟ විය නොහැකි අවස්ථාවලදී එකී ප්‍රදාන නැවත ප්‍රදානකරුවන් වෙත ආපසු යවනු ලැබේ. |

**2.2 වියදම් කළමනාකරණය**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------- | --------------- | ----------------------------------------- |
| (අ) 2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වැය විෂයයන් 06 ක් සඳහා එකතුව රු.මිලියන 1,953,750ක් වූ වෙන් කළ ප්‍රතිපාදනයට, එකතුව රු. මිලියන 119,949.1 ක් පරිපූරක ඇස්තමේන්තු මඟින් වැඩිකර තිබූ අතර, එසේ අතිරේක ප්‍රතිපාදන මඟින් වැඩිකරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය, අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 01ක සිට සියයට 43ක් දක්වා වූ පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම | මෙම දෙපාර්තමේන්තුවට වලක්වා ගත නොහැකි හේතුන්මත හා ප්‍රායෝගික තත්ත්වයන් මත පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වැඩිකර ගැනීමට සිදු විය. |

| | | |
|---|---|---|
| (ආ)වැය විෂයයන් 04 ක් යටතේ එකතුව රු. 13,329,534,978 ක් වූ අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 35ක සිට සියයට 75ක් දක්වා වූ පරාසයක් තුළ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා නොගැනීමට කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණයන් නිවැරදි වන අතර එසේ ප්‍රතිපාදන ඉතිරි වීමට හේතුන් අතර ඇස්තමේන්තු කල පරිදි විදේශ ගමන් වියදම් (පුහුණු හා වැඩමුළු නොවන) ඇති නොවීම, අදාල පරිදි ණය මුදල් වර්ෂය තුල නොලැබීම, මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේ අවසන් වූ අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ කර ඇති විශේෂ ඩොලර් ගිණුමේ ශේෂය රු.113,420,341.72 කට සීමා වූ නිසා එම සීමාව දක්වා පමණක් වියදම් දැරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම හා ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් ලබා දෙන මුදල්, අදාල ආයතන වලින් කරනු ලබන ඉල්ලීම් පදනම් කරගෙන නිදහස් කිරීමෙන් අනතුරුව මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2019 පෙබරවාරි 28 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අග්‍රිම ගිණුම් 35 ක එකතුව රු. 2,568,932,653 ක හර ශේෂ නොපියවී පැවතුණු අතර, ඉන් එකතුව රු. 498,820,040 ක් වූ අග්‍රිම ගිණුම් 04 ක ශේෂයන් 1999 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරාසයක සිට පැවත එන බව නිරීක්ෂණය විය. | අග්‍රිම ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2019.01.01 දිනට නොපියවී පැවති අග්‍රිම ගිණුම් 197 අතුරින් 181 ක් සැසඳීම් කර මේ වන විටත් නිරවුලු කර ඇති අතර 2019.04.30 දිනට තව දුරටත් නොපියවී පවතින අග්‍රිම ගිණුම් සංඛ්‍යාව 16 කි. ඒ තුළ මෙම ශේෂ පවතී. |

**(ආ)අක් මුදල් නිදහස් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් සඳහා අක්මුදල් නිදහස් කිරීම සියයට 69 ක් පමණක් වී තිබුණි. එබැවින් ප්‍රාග්ධන වියදම් සඳහා අක් මුදල් නිදහස් කිරීම 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී පහත වැටී | අක් මුදල් නිදහස් කිරීම විධිමත් කළ යුතු වීම. | අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙත භාණ්ඩාගාරය විසින් මූලධන හා පුනරාවර්තනවියදම් සඳහා අක් මුදල් නිදහස් කිරීමේ දී වාර්ෂික අක් මුදල් සීමාව, ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති නිර්දේශයන්, නිල බැංකු ගිණුම් වල |

| | | |
|---|---|---|
| තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන වියදම් සඳහා අක්මුදල් නිදහස් කිරීම ප්‍රමාණවත් පරිදි සිදු නොවන බව නිරීක්ෂණය විය. | | පවතින දෛනික බැංකු/ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදල යටතේ පවතින මුදල් තත්වයන්, සලකා බැලීම,ලබා දිය යුතු ප්‍රමුඛතාවයන් පිළිබඳව සලකා බැලනු ලැබේ. |
| (ii)රජයේ මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය ආයෝජන ලෙස දක්වා ඇති අගයන් සලකා බැලීමේදී ද, සමස්ථ රාජ්‍ය ආයෝජන වටිනාකම, 2014 වර්ෂයට සාපේක්ෂව, 2015 වර්ෂයේදී සියයට 88 ක වැඩිවීමක් හා 2016 වර්ෂයේදී සියයට 90 ක පහත වැටීමක් නිරීක්ෂණය විය. එසේම, 2017 වර්ෂයට සාපේක්ෂව, 2018 වර්ෂයේදී එය සියයට 32 ක් දක්වා පහත වැටී ඇති බව නිරීක්ෂණය වීම හේතුවෙන් ඉහත කී කරුණු තවදුරටත් තහවුරු විය. | අක් මුදල් නිදහස් කිරීම විධිමත් කළ යුතු වීම. | 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ආයෝජන වටිනාකම අඩුවීම සඳහා මූලධන වියදම් වෙනුවෙන් භාණ්ඩාගාරය ලබා දුන් අක්මුදල් අඩුවීම එක් සාධකයක් පමණක් බව නිරීක්ෂණය කරමි. ඊට අමතරව අදාළ ආයතන අක් මුදල් ඉල්ලීම හා ඒ මත ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිර්දේශ, ආයතනයේ පවතින දෛනික මුදල් ශේෂ, ඒකාබද්ධ අරමුදලේ මුදල් තත්ත්වය, ප්‍රමුඛතා සලකා බැලීම අපේක්ෂිත ආදායම නොලැබී යාම, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්ම කිරීමේදී සිදුවූ ප්‍රමාදයන් හා රු. බිලියන 58 ක් පමණ වූ විදේශ ව්‍යාපෘති මගින් සිදුවන රාජ්‍ය ආයෝජනයන් 2018 වර්ෂයේ ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොතිබීම නිසා ගිණුම්ගත කිරීමට නොහැකි වීම යන කරුණු බලපානු ලබයි. |

(ඇ) බැංකු ඇපකර හා සහන ලිපි

---------------------------

| | | |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වනවිට මහා භාණ්ඩාගාරය විසින් වාණිජ බැංකු 03 වෙත නිකුත් කරන ලද රු. මිලියන 16,435.63 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර 05 ක්, එක්සත් ජනපද ඩොලර් මිලියන 1,800 (රු. මිලියන 328,463.82) ක් වටිනා භාණ්ඩාගාර ඇපකර 03 ක්, රු. මිලියන 8,591 ක් වටිනා සහන ලිපි 05 ක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 75 (රු. මිලියන 13,706.24) ක් වටිනා සහන ලිපි 06 ක් කල් ඉකුත් වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | ඇපකර හා සහන ලිපි නිකුත් කිරීම විධිමත් ක්‍රියා මාර්ගයක් යටතේ සිදු කල යුතු වීම. | කල් ඉකුත්වූ භාණ්ඩාගාර ඇපකරවල දින දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින අතර අනෙකුත් ඇපකරවල වගකීම් පියවීමට කටයුතු කරන ලෙසත් නිකුත් කරන ලද පහසුකම් සැලසීමේ ලිපි යටතේ ලබා ගෙන ඇති ණය මුදල් කාලීන ණය මුදලක් බවට පරිවර්තනය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. |

**4. තිරසාර සංවර්ධනය**

**4.1 තිරසාර අරමුණු ලඟාකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කරගනිමින් තිරසාර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගැනීම හා ලඟාකර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානය යොමුකල යුතු වුවද ඒ අනුව 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඇතුළු සැලසුම් සකස් වී නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගත හැකි පරිදි සකස් කළ යුතු වීම. | තිරසාර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කර ගනිමින් තිරසාර සංවර්ධන අරමුණු හා දර්ශක ළඟාකර ගැනීම සම්බන්ධව ජාතික අයවැය චක්‍රලේඛ 02/2017 මත පදනම්ව මෙම දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර පත්‍රිකාවක් නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර, ඔබගේ විගණන නිරීක්ෂණ මත පදනම්ව 2019 වසරේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. |

**5. මානව සම්පත් කළමනාකරණය**

**5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් ඇතුළුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 09 ක් වී තිබුණි. | කාර්යමණ්ඩලය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ප්‍රශස්ත වන අයුරින් කළමනාකරණය කළ යුතු වීම. | මෙම පුරප්පාඩු සඳහා නිලධාරීන් ලබා දෙන ලෙස ඉල්ලා මුදල් අමාත්‍යාංශය මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් සිදුකර ඇති අතර PACIS මෘදුකාංගය හරහාද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමද සිදුකර ඇත. කෙසේ වුවද, දෙපාර්තමේන්තු කාර්යසාධනය අඩාල නොවන පරිදි දැනට සිටින කාර්ය මණ්ඩලය තුල පුරප්පාඩු තනතුරු වල රාජකාරි බෙදාදීම මගින් රාජකාරි ආවරණය කර ගැනීමක් සිදු කර ගනු ලබයි. |